# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,212 — 1960 ඔක්තෝබර් 14 වැනි සිකුරාද —14.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 521 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | | ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | | ... | 527 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : කිඉුළු 572/ජේ 58/59 එල් ජී 886.

### 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම ඉඩම් වාරිමාර්ග සහ විදුලිබලය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ කොරලවැල්ලේ, කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 128/6, 128/7, සහ 128/10 දරණ දොඹගහවත්ත නුගගහවත්ත සහ මාදන්ගහවත්ත නමැති ඉඩම් වලින් අක්කර 2½ක් පමණවූ කොටස් තුනක්, ඊට මායිම්:—

උතුරට : කොරලවැල්ලේ මිනීකනත්ත සහ කේ. ඒ. ජේම්ස් සිල්වා අයිතිකම් කියන කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 128/4 දරණ මාදන්ගහවත්ත නමැති ඉඩම ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස් සහ දොන් ඇක්මන් පෙරේරා අයිතිකම් කියන කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 136/10 දරණ නුගගහවත්ත නමැති ඉඩම ; දකුණට : ඩබ්ලිව්. මේරි පෙරේර අයිතිකම් කියන කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 136/18 දරණ නුගගහවත්ත, ඩබ්ලිව්. මයිකල් පෙරේර සහ නව කෙනෙක් අයිතිකම් කියන කොරලවැල්ල පාරේ පිහිටි නො. 136/11 සහ මිසිලින් පෙරේර අයිතිකම් කියන කොරලවැල්ල පාරේ නො. 136/10; බස්නාහිරට: දුම්රිය පාර.

කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ කොරලවැල්ලේ කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 126, 128, 128/1, 128/2, 128/3 සහ 128/5 දරණ දොඹගහවත්ත, නුගගහවත්ත සහ මාදන්ගහවත්ත නමැති ඉඩම් වලින් අක්කර ½ ක පමණවූ කොටස් තුනක්, ඊට මායිම්:—

උතුරට : මෙම ඉඩම්වල ඉතිරි කොටස් ; නැගෙනහිරට : කොරලවැල්ල-මෝදර පාර; දකුණට: මිසිලින් පෙරේර අයිතිකම් කියන කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 136/10 දරන නුගගහවත්ත, ඩබ්ලිව්. ආතර් ප්‍රනාන්දු අයිතිකම් කියන කොරලවැල්ල පාරේ පිහිටි නො. 136/9, ආර්. ජේ. ද මැල් අයිතිකම් කියන කොරලවැල්ල පාරේ පිහිටි නො. 130/7, 130/8 සහ කොරලවැල්ල පාරේ නො. 130/3 දරණ ඉඩම සහ සී. ඒ. ඇස්. ඩයස් අයිතිකම් කියන අඩි 4 ක පාර ; බස්නාහිරට : ආර්. ජේ. ද මැල් අයිතිකම් කියන (අත්කර ගැනීමට යන) කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 128/5, 128/7 සහ 130/10 දරණ දොඹගහවත්ත සහ මාදන්ගහවත්ත යන ඉඩම්.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබලය පිළිබඳ ඇමතිතුමා.

1960ක් වූ සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹදීය.

10-212

අංකය : කාණ්ඩ 597/ජේ 59/60 එල් 225 (වීජ්)

## 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහ පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥාපනතේ, 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ පද්දවල සහ මයිලවලාන ගම්මුලාදෑනි කොට්ඨාශ තුල පද්දවල සහ මයිලවලානේ ගම්වල පිහිටි අක්කර 102ක් පමණ වූ දඹුගහලන්ද නොහොත් වල්ජන්බුව නමැති ඉඩම.

ඊට මායිම් :—

උතුරට : ඩී. පී. විජේසිංහ, ඩී.ඒ.පී.බී. සමරවික්‍රම සහ ඩී. ඒ. පීරිස් අප්පුහාමි අයිතිකම් කියන ගල බැඳිකුඹුර ; ජේ. ඒ. පොඩිනෝනා, ඇම්. කේ. පුංචිසිංඤෝ, කේ. ඒ. හේරස් සිංඤෝ, ඇම්. කේ. හෙන්ද්‍රික් සිංඤෝ, ඇල්. ඒ. පීරිස් සිංඤෝ සහ ඇම්. කේ. පියදාස අයිතිකම් කියන නුගගහවත්ත ; නැගෙනහිරට : ඩී. ඩී., විජේසිංහ මහත්මයා, අයිතිකම් කියන අලුබෝගහ දෙනිය නොහොත් ඔතුකුඹුර, මයිලවලානේ ඇම්. කේ. ආරොන් අයිතිකම් කියන අලුබෝගහදෙනිය කුඹුර පිල්ලෑව, ඇම්. කේ. ඇල්පින් අයිතිකම් කියන අලුබෝගහදෙනිය නොහොත් වැලිකුඹුර, බී. ජ්. කාච්චොනෝනා අයිතිකම් කියන වැලිකුඹුර, කේ. ඒ. හේරත් සිඤ්ඤෝ සහ ඇම්. කේ. මැන්ඩිස් අප්පුහාමි අයිතිකම් කියන මල්පවර කුඹුර නොහොත් වැලිකුඹුර, ඇල්. ඒ. රපියල් සිංඤෝ ජේ. ඒ. සෝමපාල, ඩබ්ලිව්. පී. පොඩිසිංඤෝ සහ ඩබ්ලිව්. පී. සයිමන් අයිතිකම් කියන අලුබෝගහ දෙනිය කුඹුර, කේ. ඒ. සරනේලිස් සහ ඇම්. කේ. පොඩිසිංඤෝ අයිතිකම් කියන මිල්ලගහවත්ත, ජේ. පී. ඇසිලින් නෝනා සහ ජේ. පී. මේලිස් අප්පුහාමි අයිතිකම් කියන නුගගහවත්ත, අම්තිරිගල, කනුගල ඩී. ඒ. සෙනෙවිරත්න අයිතිකම් කියන පීල දෙනියෙ කුඹුර සහ පද්දවල ඩී. ඒ. සේනාරත්න සහ කේ. ඒ. පොඩි සිඤ්ඤෝ අයිතිකම් කියන දඹුගහලන්ද සහ මිතිකනත්ත ; දකුණට : ඩී. ඒ. ඊ. පල්ලෙවෙල මහත්මිය අයිතිකම් කියන දඹුගහලන්ද වත්ත ; බස්නාහිරට : ඩී. ඒ. ඊ. පල්ලේවෙල මහත්මිය සහ හිටපු ගම්පති ඩී. ඒ. සේනාරත්න අයිතිකම් කියන දඹුගහලන්ද වත්ත, ජී. ඩී. බයිස අයිතිකම් කියන දෙල් ගහකුඹුර, ජී. ඩී. පිංතෝරිස් අයිතිකම් කියන දඹුගහලන්ද වත්ත සහ ඩී. ඒ. ඊ. පල්ලෙවල මහත්මිය සහ තව අය අයිතිකම් කියන දෙල්ගහවත්ත ගෑප්.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම් වාරිමාගී සහ විදුලි බලය පිළිබඳ ඇමතිතුමා,

1960ක් වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹදීය.

10-231

---

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම්, ඉඩම් වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ අත්තරගල්ල-පල්ලේ ගම්මැද්ද වසමේ අත්තරගල්ල-පල්ලේ ගම්මැද්ද ගමේ පිහිටි අක්කර 34ක් පමණවූ රම්බොඩවත්ත නමැති ඉඩමට මායිම් :

උතුරට : මඩවල-තෙල්දෙනිය ප්‍රසිද්ධ පාර සහ කේ. ඩී. ඇම්. සෙනෙවිරත්න මහතා විසින් අයිතිවාසිකම් කියන උඩගෙදරහේන නමැති ඉඩමද, කේ. ඇම්. සී. සෙනෙවිරත්න මහත්මී විසින් අයිතිකම් කියන උඩකනත්තේ වත්ත නමැති ඉඩමද, ආර්. මුත්තයියා මහතා සහ තවත් දෙදෙනෙකු විසින් අයිතිකම් කියන පල්ලේකනත්තේ වත්තද ; නැගෙනහිරට : පී. මානික්කම් පිල්ලේ මහතා විසින් අයිතිවාසිකම් කියන උඩකනත්තේවත්ත කියන ඉඩමද, ආර්. මුත්තයියා සහ තවත් දෙදෙනෙකු විසින් අයිතිවාසිකම් කියන පල්ලේකනත්තේවත්තද ; දකුණට : රජ වැල්ලවත්ත සහ කඳුරද; බස්නාහිරට: ඊ. එච්. ඩයස් දොස්තර මහතා විසින් අයිතිකම් කියන කොලොන්ගහවත්තද.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී සහ විදුලිබලය පිළිබඳ ඇමතිතුමා.

1960ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹදීය.

10-227

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායඝියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම්, ඉඩම්, වාරිමාගී සහ විදුලිය පිළිබඳ අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින්, ප්‍රකාශ කරමි :—

මහනුවර දිස්ත්‍රික්කයේ මැද දුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ, මහදොරලියද්ද ගම්මුලාදෑනි කොට්ඨාශයේ මහදොරලියද්ද ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 2ක් පමණවූ දඹගස්තැන්න වත්ත නමැති පහත මායිම් සඳහන් ඉඩම් කොටස—

උතුරට, නැගෙනහිරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; බස්නාහිරට : හල්ලියද්ද තැන්නෙලන්ද, ගම්සභා පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිය පිළිබඳ ඇමතිතුමා.

සඳහන් අංකය : ජේ. 59/60. ඊ. 353 " කේ." ඇල්.ඩී/ඒ. 98.

1960ක් වූ අගෝස්තු මස 13 දින,
කොළඹදීය.

10—309.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායඝියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන් යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම්, ඉඩම්, වාරිමාගී සහ විදුලිය පිළිබඳ අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම් ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ රඹුක්පිටිය ගම්මුලාදෑනි කොට්ඨාශයේ රඹුක්පිටිය ගමෙහි පිහිටි හල්දෙරවත්ත නමැති ප්‍රමාණයෙන් අක්කර .3ක් පමණ වූ පහත සඳහන් මායිම් ඇති ඉඩම් කොටස—

උතුරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : ගිනිගත්හේන—නාවලපිටිය ප්‍රසිඛ පාර ; දකුණට : ඩී. දේවරාජ් සහ පී. සප්පානි පිල්ලේ අයිතිවාසිකම් කියන හැරන් ඩේල්වත්ත.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිය පිළිබඳ ඇමතිතුමා.

සඳහන් අංකය : ජේ/58/59 ඊ 421—ඇල් ඩී/ඒ. 59.

1960 සැප්තැම්බර් මස 12 දින,
කොළඹදීය.

10—310.

## 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ උඩගම ගම්මුලාදෑනි කොට්ඨාශයේ මහරගම්මැද්ද ගම පිහිටි අක්කර 38ක් පමණවූ හීපිටියවත්ත නමැති ඉඩමට මායිම් :—

උතුරට : පි. ජී. ගුණසේකර මහතා සහ තවත් අය විසින් අයිතිකම් කියන එම ඉඩමේ කොටසද, සුසානභූමිය සහ මඩවල-තෙල්දෙනිය ප්‍රසිඛ පාරද, ආර්. ජී. නන්දෝරිස් මහතා විසින් අයිතිකම්කියන පිහිඹියගොල්ල නමැති ඉඩමද, ජී. ජී. නන්දුවා මහතා විසින් අයිතිකම්කියන ගලපිටියේ ගෙදරවත්තද, කේ. රාජපක්ෂ මහත්මී සහ තවත් අය විසින් අයිතිකම් කියන තනිපොල්ගස් තැන්න නමැති ඉඩමද ; නැගෙනහිරට : කේ. රාජපක්ෂ මහත්මී සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන තනි පොල්ගස් තැන්න නමැති ඉඩමද, ආර්. ගුණවර්ධන මහතා සහ තවත් අය විසින් අයිති කියන ගල්බොක්කේගේ නද ; දකුණට : ඊ. බණ්ඩියා මහතා සහ තවත් අය විසින් අයිතිය කියන හීපිටියේ වත්තේ කොටසද, ඇම්. ඇම්. ජී. පුංචා මහතාටද, කේ. ජී. උක්කු අම්මා මහත්මිටද, ඇම්. ජී. පුංචා, ඇම්. ජී. පිකිරා, එච්. ජී. නයිදේ යන මහත්වරුන්ට අයිතිය කියන හීපිටියේ වත්තේ කොටස්ද, කේ. ජී. උක්කුඅම්මා මහත්මී විසින් අයිතිවාසිකම් කියන උඩගෙදර ගේනද, ඇම්. ජී. ලීලාවතී මහත්මී සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන කපුකොටුවේගේනද ; බස්නාහිරට : ඇම්. ඇම්. සොබනී මහත්මී විසින් අයිතිවාසිකම් කියන හීපිටියේවත්තේ කොටසද, ලයනල් සමරතුංග මහත්මයා විසින් අයිතිවාසිකම් කියන මඩුගස්තැන්න නැමැති ඉඩමද කේ. ජී. නන්දුවා, මහතාද, කේ. ජී. ඩිංගිරි මහත්මිද, කේ. ජයසේන මහතාද, තවත් අයවලුන් විසින්ද අයිතිවාසිකම් කියන මඩුගස්තැන්න නමැති ඉඩමේ කොටසද.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමතිතුමා.

සඳහන් අංකය : ජේ. 58/59 ඇල් 681 (ඩී.ර්) ඇල්. ඩී. බී. 28.

1960ක්වූ සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දීය.

10—311.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කිරිවත්එළිය ගම්මුලාදෑනි කොට්ඨාශයේ කිරිවත්එළිය ගමෙහි පිහිටි කැන්ද ඇලමුලගේන නමැති ප්‍රමාණයෙන් අක්කර 1 3/4 පමණවූ ඉඩමට මායිම් :—

උතුරට : කේ. බී. ඇම්. සිරිවර්ධන විසින් අයිතිවාසිකම් කියනු ලබන එගලමුලගේන නමැති ඉඩම සහ මල ඇල ; නැගෙනහිරට : ගම් සභා පාර ; දකුණට : නෝර්ටන්-මස්කෙළිය ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට: කේ. බී. ඇම්. සිරිවර්ධන සහ වෙනත් අයකු විසින් අයිතිවාසිකම් කියනු ලබන එගලමුල්ගේන නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ ඇමති.

සඳහන් අංකය : ජේ. 57/58. ඊ. 322 කේ./එල්. ඩී./ඒ-12.

1960 අගෝස්තු මස 6 දින,
කොළඹ දීය.

10—312

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනයවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

ගාළු දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ඉගල ගම්මුලාදෑනි වසමේ, ඉගළ නමැති ගමේ පිහිටා තිබෙන කහඹිලියාගොඩ බැද්දෙදෙනිය නමැති ඉඩමින්, අක්කර ½ක් පමණවූ පහත සඳහන් මායිම් තුළ ඇති කොටස :—

උතුරට : ඇම්. සිරිමාන්න, හිමිකම් කියන එම ඉඩමේ කොටසක් ; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : ඇල්පිටිය-පිටුවල ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : කේ. ඩී. දිනෙස් අප්පුහාමි හිමිකම් කියන “ දහයෙ කනුව ලඟ පාරෙන් උඩ කට්ටිය ” නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය පිළිබඳ ඇමතිතුමා.

සඳහන් කළ යුතු අංකය : ජේ 57/58 ඒ ඇෆ්. 81 ඇල්.ඒ./සී./70.

1960ක්වූ සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹදීය.

10—285.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධනයවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශනයයි

1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනයවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ ඇමති නැත්පත් චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය බවත් එය එම ආඥාපනත යටතේ රජයට ලබාගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි :

(1) වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා දකුණු ආදායම් පාලක කොට්ඨාශයේ වාකයිකඩ්ඩිනාඑලුක්කුලම් ගම්මුලාදෑනි වැයික්කිය තුළ මුතලියාකුලම් නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 4, රූ. 1, ප. 0ක් විශාලවූ කීල්කබු නමැති ඒකාබද්ධ ඉඩම් කැබලි තුනට මායිම් :—

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරටත් : ආණ්ඩුවේ ඉඩම ; දකුණට : ඇල (රජයට ගනු ලබන්නේ බදු අයිතිය පමණකි).

(2) වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා දකුණු ආදායම් පාලක කොට්ඨාශයේ වාකයිකඩ්ඩිනාඑලුක්කුලම් ගම්මුලාදෑනි වැයික්කිය තුළ මුතලියාකුලම් නැමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 13ක් විශාල වූ තිල්කබු නමැති ඉඩමට මායිම් :—

උතුරට : සවකින් ඇල්ප්‍රඩ් සහ තවත් අය අයිතිකම් කියන වෙන්ද කඩ්ඩුවයාල් නමැති ඉඩම ; නැගෙනහිරට : ආණ්ඩුවේ ඉඩම ; දකුණට : ඇල ; බස්නාහිරට : ආණ්ඩුවේ ඉඩම සහ ඇල (රජයට ගනු ලබන්නේ බදු අයිතිය පමණකි).

(3) වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා දකුණු ආදායම් පාලක කොට්ඨාශයේ වාකයිකඩ්ඩිනාඑලුක්කුලම් ගම්මුලාදෑනි වැයික්කිය තුළ මුතලියාකුලම් නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 14, රූ. 1, පා. 30ක් විශාලවූ වෙන්තකඩබුවායල් නමැති ඒකාබඩ ඉඩම් කැබලි ඊට මායිම් :—

උතුරට : ඇල ; නැගෙනහිරට : පී. ජොසප්, ඇස්. පිලිප්පයියා සහ තවත් අයෙක් සහ ඇම්. සන්තන් විසින් අයිතිකම් කියන මෙම ඉඩමේම කොටස් ; දකුණට සහ බස්නාහිරට : ආණ්ඩුවේ ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල පිළිබඳ ඇමති.

අංකය : ජේ. 56. ඇල්. 295.

1960 සැප්තැම්බර් 20 වැනි දින,
කොළඹ.

10-366

අංකය: ඇල්. ඇල්/ඒ.6315.

## 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් අත්කර ගැනීමේ ආඥපණතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගොවිකම්, ඉඩම්, වාරි මාර්ග හා විදුලිබල සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙසින් ප්‍රකාශ කරමි:

රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් පාලක තැනගේ කොට්ඨාශයේ වැද්දගල කුඩව නමැති ගමේ පිහිටි (අංක 947 දරණ ගම් සිතියමේ ලොට් 75) දූන්හේනමූකලාන නොහොත් කොස්ගුලනගහමූකලාන සහ (අංක 947 දරණ ගම් සිතියමේ ලොට් 66) මාවි කුඹුරහේන නමැති එකට යාව ඇති කොටස් 2න් අක්කර 3ක පමණ ප්‍රමාණයක්, එහි මායිම් පහත දැක්වේ:—

උතුරට: අංක 947 දරණ ගම් සිතියමේ ලොට් 75, 70 සහ 66 කොටස්; නැගෙනහිරට: අංක 947 දරණ ගම් සිතියමේ ලොට් 66 කොටසක්; දකුණට: අංක 947 දරණ ගම් සිතියමේ ලොට් 66, 75 සහ 193 කොටස්; බස්නාහිරට: අංක 947 දරණ ගම් සිතියමේ ලොට් 75 කොටසක්.

සී. පී. ද සිල්වා,
ගොවිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිතුමා.

අංකය: ජේ 57/58 ඊ 637.
1960 ක්වූ අගෝස්තු මස 30 වැනි දින,
කොළඹදීය.

10-185

---

## 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ සංශොධිත ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගොවිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙසින් ප්‍රකාශ කරමි:

රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ දෙනවක උඩකඩ ගම්මූලාදෑනි කොට්ඨාශයේ, පැල්මඩුල්ලේ, බත්ගන්ගොඩ, නමැති ගමේ පිහිටි (අංක 196 දරන අවසාන ගම් සිතියමේ ලොට් 50 කොටසක්වූ) පිටිය නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 4 ක පමණ ප්‍රමාණයක් සහ එහි මායිම් පහත දැක්වේ:—

උතුරට සහ නැගෙනහිරට: වලව්වත්ත නමැති එම ඉඩම් කැබැල්ලේ ඉතුරු කොටස්; දකුණට: ගොඩකුඹුර ඔවිට සහ අඹිපාර; බස්නාහිරට: ක්ලබ් පාර.

සී. පී. ද සිල්වා,
ගොවිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමතිතුමා.

සැඳුම් අංකය: ජේ. 58/59 ඇල්ජී. 434/ඇල් ඇල්/ඒ. 6454.
1960 ක්වූ අගෝස්තු මස 31 වැනි දින,
කොළඹදීය.

10-186

---

අංකය: කිව් ඒ 431

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජයට ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජයට ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් දැනුම් දී සිටිමි:

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මූලික සිතියමේ අංකය: ඒ 4,551. ගම—රතම්බලේ

**කැබැල්ල: 1.**

ඉඩමේ නම: කහටගහ වත්ත නොහොත් මිල්ලගහ වත්ත; විස්තරය: අවුරුදු 20-40 ටත් අතර වයසැති පොල්ගස් 96 ක්, අවුරුදු 5-15ත් අතර වයසැති පොල්ගස් 13ක්, අවුරුදු 30-50ත් අතර වයසැති කොස් ගස් 3ක්, අවුරුදු 15-20 ටත් අතර වයසැති දොඹගස් 2ක්, අවුරුදු 10-20ත් අතර වයසැති කජු ගස් 3ක් සහ අවුරුදු 5-10ක් අතර වයසැති පුවක් ගස් 6ක් ඇති පොල් ඉඩම; අයිතිකම් කියන අය: ජී. විජේසිංහ, "සිංහ සෙවන" කොටාපාර, බොරැල්ල; ප්‍රමාණය: අ. 1, රූ. 2, ප. 03.7.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 නොවැම්බර් මස 14 වැනි දින පස්වරු 2.30 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 නොවැම්බර් 4 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ආර්. ද සිල්වා,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වර්ෂ 1960 ක්වූ සැප්තැම්බර් මස 20 දින,
කොළඹ කච්චේරියේදීය.

9591

---

අංකය: කපු. බී 176

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

**31 බී වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් ආණ්ඩුවට අයත් කර ගැන්ම නිසා එකී ඉඩම් එකිනෙකට ගෙවනු ලබන පහත සඳහන් වන්දි මුදල් පහත සඳහන් උසාවියට ගෙවන ලද බවත්, ඒ සඳහා අයිතිකම් කියන යම් අයකු හෝ අයවලුන් වේ නම් ඒ ලබා ගත යුතු බවත්, 1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950 අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥ පනතේ 31 වෙනි වගන්තියේ පරිදි කොළඹ රජයේ සහකාර දිසාපති වන මම මෙයින් දැනුම් දෙමි.

සී. ආර්. ද සිල්වා,
කොළඹ රජයේ අතිරේක සහකාර දිසාපති.

1960 ක්වූ සැප්තැම්බර මස 27 වෙනි දින,
කොළඹ දී ය.

### උපලෙඛනය

| ඉඩම | වන්දි මුදල රු. ශත | නඩු නොම්මරය |
|---|---|---|
| 1. බටහිර සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ කිරිමැටියාගාර පිහිටි ගොරකගහ වත්ත ඒ 4,281 දරණ මූලික සිතියමේ 1 වැනි කැබැල්ල | 153 55... | ගම්පහ රික්වැස්ට් උසාවියේ 11/එල්ඒ |
| 2. බටහිර සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ කිරිමැටියාගාර පිහිටි ගොරකගහවත්ත ඒ 4,281 දරණ මූලික සිතියමේ 2 වැනි කැබැල්ල | 40 94... | ගම්පහ රික්වැස්ට් උසාවියේ 12/එල්ඒ |
| 3. බටහිර සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ කුරුකුලාව පිහිටි වැලි කුඹුර ඒ 4,281 දරණ මූලික සිතියමේ 12 වැනි කැබැල්ල | 8 53... | ගම්පහ රික්වැස්ට් උසාවියේ 13/එල්ඒ |
| 4. බටහිර සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ කුරුකුලාව පිහිටි වැලි කුඹුර ඒ 4,281 දරණ මූලික සිතියමේ 15 වැනි කැබැල්ල | 96 68... | ගම්පහ රික්වැස්ට් උසාවියේ 14/එල්ඒ |
| 5. බටහිර සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ කුරුකුලාව පිහිටි කුට්ටුව ඒ 4,281 දරණ මූලික සිතියමේ 17 වැනි කැබැල්ල | 12 85... | ගම්පහ රික්වැස්ට් උසාවියේ 21/එල්ඒ |
| 6. බටහිර සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ කුරුකුලාවේ පිහිටි ගල හිටියාව ඒ 4,281 දරණ මූලික සිතියමේ 19 වැනි කැබැල්ල | 108 05... | ගම්පහ රික්වැස්ට් උසාවියේ 15/එල්ඒ |

10-238

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සිතියමේ නො. ඒ 4,526. ගම : කොස්ගම පහල

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : සාලාව ඇස්ටේට් ; විස්තරය : රබර් (ගලවා දමන ලද) ; අයිතිකම් කියන අය : ආනන්ද ඊ. ද සිල්වා, කොටහේන මිල්ස්, කොටහේන, කොළඹ ; ප්‍රමාණය : අ. 2, රූ. 0, ප. 15.7.

**එකතුව : අ. 2, රූ. 0, ප. 15.7.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 1960 දෙසැම්බර් මස 8 වැනි දින පෙරවරු 10 වේලාවට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 දෙසැම්බර් මස 1 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත.

අංකය : කිව්. බී. 374.

වර්ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 23 දින,
කොළඹ කච්චේරියේදීය.

10-315

---

අංකය : කනුළු 582.

## 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කල පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරන සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මුල්පිඹුරේ නො. ඒ 4,552. ගම—තිත්තපත්තර

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : මහවලවත්ත ; විස්තර : අතුසෙවිලිකළ පැලක් සහ කලුගලක් ඇති අවුරුදු 5-50ක්වූ පොල් ඉඩම ; අයිතිකම් කියන අය : ඩන්වන් ගැමුණු ඔබේසේකර, 24, ක්ලිපඩ් ක්‍රසන්ට්, කොළඹ 7 ; ප්‍රමාණය : අ. 31, රූ. 2, ප. 32.3.

**කැබැල්ල : 2.**

ඉඩමේ නම : මහවලවත්ත ; විස්තර : අවුරුදු 5-50ක්වූ පොල් ඉඩම ; අයිතිකම් කියන අය : ඩන්වන් ගැමුණු ඔබේසේකර, 24, ක්ලිපඩ් ක්‍රසන්ට්, කොළඹ 7 ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 18.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 දෙසැම්බර් මස 7 වෙනි දින පස්වරු 2.30ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1960 නොවැම්බර් මස 30 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තතුමා.

වර්ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 5 දින,
කොළඹ කච්චේරියේදීය.

10-345.

---

අංකය : ඇල් එච්/ඩී. 62.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පින්වල ගමේ පිහිටි, අංක ඒ 4,579 දරණ මුල් සැලැස්මේ කැබලි අංක 1.

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : ගොඩපරගහවත්ත ; විස්තරය : අවුරුදු 2 ක්වූ රබර් පැල 235 ක්ද, අවුරුදු 15 ක්වූ අඹ ගස් 2 ක්ද, අවුරුදු 1½ ක්වූ කෙසෙල් ගස් 4 ක්ද, අවුරුදු 2 ක්වූ රටදෙල් ගසක්ද සහ ස්ථිර උළුසෙවිලි කල ගෙයක් සහිත රබර් ඉඩම. අවුරුදු 45 ක්වූ පොල් ගස් 156 ක්ද, අවුරුදු 15ක්වූ පොල් ගස් 26ක්ද, අවුරුදු 10ක්වූ පුවක් ගස් 25ක්ද, අවුරුදු 3ක්වූ රටදෙල් ගස් 3ක්ද, අවුරුදු 5ක්වූ කොට්ටන් ගස් 3ක්ද, අවුරුදු 30ක්වූ අඹගස් 2ක්ද, අවුරුදු 15ක්වූ අඹගස් 3ක්ද, අවුරුදු 6ක්වූ අඹගස් 5ක්ද, අවුරුදු 4ක්වූ කොස් ගස් 2ක්ද, අවුරුදු 20ක්වූ බෙලිගස් 2ක්ද, අවුරුදු 5ක්වූ කපු ගස් 2ක්ද, අවුරුදු 30ක්වූ සියඹලාගස් 1ක්ද, අවුරුදු 7ක්වූ හල්මිල්ල ගස් 27ක්ද, අවුරුදු 6ක්වූ නැදුන් ගස් 10 ක්ද, අවුරුදු 2 ක්වූ හොර ගසක්ද, අත්හැර දමන ලද ළිං දෙකක් සහ ගේට්ටුවක් සහිත වත්ත ; හිමිකම් කියන අය : ටී. එච්. ඇම්. ප්‍රනාන්දු නෝනාමහත්මිය, "ශ්‍රියාගාර", පානදුර ; ප්‍රමාණය : අ. 6, රූ. 1, ප. 08.9.

**මුළු ප්‍රමාණය. අ. 6, රූ. 1, පර්. 08.9.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 නොවැම්බර් 25 වැනි දින පූ. භා. 10 ට පානදුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 නොවැම්බර් 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

කේ. බී. දිසානායක,
කළුතර ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 ඔක්තෝබර් 3 වැනි දින,
කළුතර කච්චේරිය.

10-208

---

අංකය : ඇල්එච්/ඩී. 25.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ, අළුත්ගම්විදිය සුළු නගරසභා සීමාව තුළ අංක 5 දරණ කොට්ඨාශයේ, හෙට්ටිවත්ත ගමේ පිහිටි, අංක ඒ 4,566 දරණ මුල් සැලැස්මේ කැබලි අංක 1 සිට 4 දක්වා.

**කැබලි අංකය : 1.**

නම : දිගනඹිවිට, අභ්‍යාස විද්‍යාලය පාරේ වරිපනම් අංක 84 ; විස්තරය : අවුරුදු 20 සිට 25 දක්වාවූ පොල් ගස් 35ක්ද, අවුරුදු 3 සිට 5 දක්වාවූ පොල් ගස් 8ක්ද, අවුරුදු 6ක්වූ පුවක් ගස් 3ක්ද, අවුරුදු 10ක්වූ අඹ ගස් 2ක් සහ ගරාවැටුනු බදාමෙන් තනකලද උළු

සෙවිලිකළ ගෙයක් ද සහිත ඉඩම; හිමිකම් කියන අයගේ නම: ඒ. ඒ. ඇම්. සාහිර් හජ්ජියාර්, කෙලින් වීදිය, "රිවර් සයිඩ්", ධර්ගා නගරය; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 14.5.

**කැබලි අංකය: 2.**

නම: දිගනඹිවිට, අභ්‍යාස විද්‍යාලය පාරේ වරිපනම් අංක 48; විස්තරය: අවුරුදු 20 සිට 25 දක්වාවූ පොල් ගස් 70ක් ද, අවුරුදු 3 සිට 4 දක්වාවූ පොල් ගස් 4ක් ද, අවුරුදු 8ක්වූ අඹ ගසක් ද සහ ගැල්වනයිස් කනු සහ පීල්ල සහිත ගැල්වනයිස් තහඩු වලින් තැනුන වහල සහ බිත්ති සහිත ගොඩනැගිල්ලක් ද තිබේ. බිම ස්ථිර සිමෙන්ති බදාමෙන් තනා තිබේ; හිමිකම් කියන අයගේ නම: අයි. ඇල්. ඇම්. මොහමඩ් හජ්ජියා, අළුත් පාර, ධර්ගා නගරය; ප්‍රමාණය අ. 0, රූ. 2, ප. 19.4.

**කැබලි අංකය: 3.**

නම: මයිමිය දිගනවත්ත, අභ්‍යාස විද්‍යාලය පාරේ වරිපනම් අංක 65/3; විස්තරය: අවුරුදු 20 සිට 25 දක්වාවූ පොල් ගස් 14ක් ද, අවුරුදු 7ක්වූ අඹ ගසක් ද සහ අවුරුදු 10ක්වූ මාර ගසක් ද සහිත ඉඩම; හිමිකම් කියන අයගේ නම: ඇම්. ඒ. ඇම්. කසේන්, මීරිපැන්න පාර, ධර්ගා නගරය, ඇම්. ඒ. ඇල්. ඇම්. හුසේන්, ඇම්. ඒ. ඇල්. ඇම්. තාහිර්, ඇම්. ඇම්. ඇල්. ඒ. මොහමඩ් අබුබකර් සහ ඇම්. ඒ. ඇල්. ඇම්. උම්මුනෝනා, කෙලින් වීදිය, "රිවර් සයිඩ්", ධර්ගා නගරය, ඒ. ඇල්. ඇම්. ඉබ්‍රාහිම්, සේවියර් පාර, ධර්ගා නගරය, ඒ. ඇල්. ඇම්. අබ්දුල් වඩූඩ්, කෙලින් වීදිය, ධර්ගා නගරය, ඒ. ඇල්. ඇම්. අබ්දුල් හමීඩ්, අළුත් පාර, ධර්ගා නගරය, ඇම්. ඇම්. ඇල්. පතුමුත්තු සෙහාරා, හාජි ලේන්, ධර්ගා නගරය; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 24.5.

**කැබලි අංකය: 4.**

නම: මයිමියවත්ත, අභ්‍යාස විද්‍යාලය පාරේ වරිපනම් අංක 42; විස්තර: අවුරුදු 20 සිට 25 දක්වාවූ පොල් ගස් 64ක් ද, අවුරුදු 7ක්වූ දෙල් ගස් 3ක් ද, අවුරුදු 8ක්වූ අඹගස් 7ක් ද සහ පොල් අතු සෙවිලි කළ මැටි ගෙයක් ද සහිත ඉඩම; හිමිකම් කියන අයගේ නම: අල් හජ් ඇම්. ඒ. fපාතා, අභ්‍යාස විද්‍යාලය පාර, ධර්ගා නගරය, ඕ. මොහමඩ්, ධර්ගා නගරය; ප්‍රමාණය: අ. 0, රූ. 2, ප. 15.8.

**මුළු ප්‍රමාණය: අ. 1, රූ. 2, ප. 34.2.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 නොවැම්බර් 26 වැනි දින පූර්වභාග 9.30ට කළුතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 නොවැම්බර් 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1960 ඔක්තෝබර් 3 වැනි දින,
කළුතර කච්චේරිය.
10-209

---

අංකය: ඇල් ඩී./5016.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

ගම්පොල හොඩියාදෙනියේ තෝරගස්පිටියේ පරණ විහාරේ එන්. සරණංකර හිමියන් විසින් අයිතිවාසිකම් කියන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගඟපළාත කෝරලේ වැලිගල්ල ගම්මුලාදැනි කොට්ඨාශයේ උඩ අළුදෙනිය ගමෙහි පිහිටි අඹකොටේහේන නමැති ඉඩමෙන් පී. පී. ඒ. 2678 දරණ සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති රූ. 2, පර්චස් 24.7 වූ කොටස.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 නොවැම්බර් මස 16 වැනි දින පූ. භා. 11 ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 නොවැම්බර් මස 9 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ඉහත කී ඉඩමට තම තමන්ගේ අයිතිවාසිකම් දක්වෙන ඔප්පු සහ වන්දි මුදල් සඳහා ලියකියවිලි විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 ඔක්තෝබර් මස 3 වැනි දින,
මහනුවර කච්චේරිය.
10-228

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරන ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර කොට්ඨාශයේ, පල්ලේගම්පහ කෝරළේ උඩුගොඩ ගමේ පිහිටි, මූල් ප්ලෑන් නො. ඒ 2,710, ලොට් අංක 1 වශයෙන් මැන හැඳින්වෙන අ. 17, රූ. 2, ප. 30ක් වූ ගිලාර්ඩ්ස් ටවුන් නමැති ඉඩමට අයිතිවාසිකම් කියන්නේ: මහනුවර, ක්‍යුවීක්ස් හෝටලේ කාමර අංක 37 පදිංචි සීමාසහිත විලියම් සහ සහෝදරයෝය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 නොවැම්බර් 23 වැනි දින පූ. භා. 11 ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1960 නොවැම්බර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද, එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලු ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 ඔක්තෝබර් මස 5 වැනි දින,
මහනුවර කච්චේරිය.
10—280.

---

සඳහන් අංකය: ඇල්ඒ. 490.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

මහාජන කාය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

ඇf්ප්. වී. පී. 197 අතිරේක අංක 5: ඌව පළාත, බදුලු දිස්ත්‍රික්කය, උඩුකිඳ ආදායම් නිලධාරි කොට්ඨාශය, දෙහිවිණිපළාත කෝරළය, ඇටම්පිටිය.

**කැබැලි අංකය: 112**

ඉඩමේ නම: කලටියෙරුප්පෙවත්ත; විස්තරය: ස්ටෝරුකාමර 1 සහ බඳනා ලද වතුර ටැන්කි 2ක් සහිත හේන; හිමිකම් කියන අය: කේ. වී. ඩී. සුමනදාස, ඇටම්පිටිය; බිම් ප්‍රමාණය: අක්. 0, රූඩ්. 0, පර්. 17.5.

**එකතුව: අ. 0, රූ. 0, ප. 17.5.**

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 නොවැම්බර් මස 18 දින පෙ. ව. 10 ට වැලිමඩ ආදායම් නිලධාරී කාර්යාලයේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1960 නොවැම්බර් 10 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තවද ඒ ඉඩම සම්බන්ධයෙන් අයිතිවාසිකම් තහවුරු කර ගැනීමේ හා ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුය.

ඇල්. අයි. ජේ. සිල්වා,
බදුලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

බදුල්ලේ කච්චේරිය,
1960 ඔක්තෝම්බර් මස 8 දාය.
10-313

සඳහන් අංකය; ඇල්. ඒ. 533.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපණත

### 7වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

ඌව පලාත, බදුලු දිස්ත්‍රික්කය, හපුතලේ ආදායම් නිලධාරී කොට්ඨාශය, මහ පලාත කෝරලේ, බන්ඩාරවෙල නගර සීමාව තුළ පිහිටි කොට්ඨාශ අංක 5 (ඉහල) කහවේවෙල කොටස පී. පී. ඒ. 357.

**කැබැලි අංකය : 1.**

ඉඩමේ නම : බන්ඩාරවෙල නගර සහා සීමාව තුල පිහිටි වරිපනම් අංක 14න් කොටසක් ; විස්තරය : අවුරුදු 20ක් වයස ඇති සයිප්‍රස් ගස් 4ක්, පාලු ලිඳක්, පාලු ටෙනිස් පිටියක්, බදාමෙන් බඳින ලද කානුවක් සහ බදාමෙන් බඳින ලද පඩි සහිත ඉඩම ; හිමිකම් කියන අය : සීමාසහිත මිලර්ස් සහ සමාගම, කොළඹ, පාලන අධ්‍යක්ෂ සැම් ද වොස් දොස්තර මයා ; බිම් ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 09.9.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 නොවැම්බර් මස 16 දින පෙ. ව. 10ට බදුල්ලේ කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1960 නොවැම්බර් මස 8 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තවද ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීමේ හා ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුනු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුය.

ඇල්. අයි. ජේ. සිල්වා,
බදුලු දිසාවේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

බදුලු කච්චේරිය,
1960 ඔක්තෝම්බර් මස 8 දාය.
10-314

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : එල්. එස්. 4665.

## 21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනය යි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ආදායම් පාලක කොට්ඨාශයේ දිවුලානේ පිහිටි බී. ඕ. ජී. 297 තේ 49 වැනි බිම් කැබැල්ලෙන් අක්කර ½ක පමණ රජයේ ඉඩම් කැබැල්ලක් වී ගබඩාවක් හා කාර්යාලයක් සෑදීම පිණිස දිවුලානේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කටයුත්ත සඳහා දීමට තිබේ. රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට එම ඉඩම බදු දීමට රජය අදහස් කර ඇත.

(අ) කාලය : අවුරුදු 30. යි.

(ආ) බද්ද : අවුරුද්දකට රුපියල් 5 යි.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුද්දක් ඇතුළත පොළොන්නරුවේ සමූපකාර උප කොමසාරිස්තුමා විසින් කලින් අනුමත කරන ලද සැලසුම් අනුව මෙම ඉඩමෙහි වී ගබඩාවක් සහ කාර්යාලයක් තනා නිම කළ යුතුයි.

(ඇ) බදු ගන්නා විසින් මෙම ඉඩම ගබඩාවක් සහ කාර්යාලයක් තැනීම පිණිස යොදනවා විනා අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නො දිය යුතු බවට පිළි ගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹදී ය.
10-191

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.